# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2472/49 - 2026 ජනවාරි මස 23 වැනි සිකුරාදා - 2026.01.23**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ඉඩම් අමාත්‍යාංශයේ අංකය*: 4-3/15/2018/VE/294.
*ප්‍රා.ලේ. යොමු අංකය*: KMB/LAN/ACQUI/02/90.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/ පරවශතාවය ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර :-*

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 330, කඹුරුපිටිය ග්‍රාම නිලධාරි වසමේ පිහිටි කැඩැස්තර සිතියම් අංක 820239 හි කලාප අංක 05, පත්‍ර අංකය 2 හි පෙන්නුම් කරන පහත සඳහන් ඉඩම් කොටස් (02):

**කැබලි අංක 01**
ඉඩමේ නම: රටලංකාවත්ත; විස්තරය: ගෙවත්ත, අවුරුදු 15 - 20 ක් පමණ වයසැති කුරුඳු වගාවක්, මිශ්‍ර භෝග වගාවක්, අවු. 20 - 25 ක් පමණ වයසැති කොස් ගස් 2 ක් සහ අවු. 5 - 10ක් පමණ වයසැති කොස් ගස් 4ක් ඇත; හිමිකම් කියන අය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, හෙක්ටර් කොබ්බෑකඩුව මාවත, කොළඹ 07; ප්‍රමාණය: හෙක්. 0.2317.

**කැබලි අංක 02**
ඉඩමේ නම: රටලංකාවත්ත; විස්තරය: ලඳු කැලය; හිමිකම් කියන අය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, හෙක්ටර් කොබ්බෑකඩුව මාවත, කොළඹ 07; ප්‍රමාණය: හෙක්. 0.9826.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියකියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2026.03.23 වැනි දින පෙ.ව. 10.00 ට කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2026.03.16 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ පරවශතාවය සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල සහ ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

**එන්. ඩී. පී. රණසිංහ,**
ප්‍රාදේශීය ලේකම්,
කඹුරුපිටිය.

2026 ජනවාරි මස 19 වැනි දින,
කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 01 - 0236




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මු.පි.මා. 931හි කැබලි අංක 10 හා කැබලි අංක 22 (මු.පි.මා. 931 සංශෝධිත පිඹුරේ කැ.අ. 153, 154, 155) කැබලි සඳහා හිමිකම් පරීක්ෂණයට අදාළව එකී ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් පවතින සියලු දෙනාම තම තමන්ගේ හෝ ඔවුන්ගේ ලියවිලිවලින් හෝ බලයලත් අයවලුන් පහත සඳහන් දිනයන්හි පෙ.ව. 9.30ට දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තවද 2026 පෙබරවාරි 21 වන දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා ඔප්පු, පිඹුරු හා වෙනත් ලියවිලි මෙම පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුයි.

මු.පි.මා 931හි කැබලි අංක 10 සහ 22 (153, 154, 155); විභාග පවත්වන දිනය: 2026.02.28

**එන්. එම්. උපේක්ෂා කුමාරි,**
ප්‍රාදේශීය ලේකම්,
දඹුල්ල.

2026 ජනවාරි මස 19 වැනි දින,
දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 01 - 0237

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.